# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2186/10 - 2020 ජූලි මස 28 වැනි අඟහරුවාදා - 2020.07.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මාගේ අංකය*: ARA/LND/ACQVI/D3/25.
*ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශ අංකය* : 4-3/09/2015/SW/416.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තරය* :-

සබරගමුව පළාතේ කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුන්පළාත පත්තුව සුළු කොට්ඨාසයේ අංක 47සී, මෝරාගම්මන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, මෝරාගම්මන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් 2020.02.27 දිනැතිව පිළියෙල කරන ලද අංක මු. පි. කෑ. 3769 දරන මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0212 පමණ වූ පල්කුඹුර නැමැති ඉඩම සඳහා මායිම්:

1. **කැබලි අංක 01 - ඉඩමේ නම: පල්කුඹුර; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0212.**

**මායිම්** :

*උතුරට* : මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය) සහ පල්කුඹුර ; *නැගෙනහිරට* : පල්කුඹුර ; *දකුණට* : පල්කුඹුර සහ ඇළ; *බටහිරට* : ඇළ සහ මාර්ගය (මාර්ග සංවර්ධන අධිකාරිය).

*වෙනත් කරුණු* :- ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) වගන්තිය යටතේ පවරා ගන්නා ලදී. මුල් හිමිකම් පාන්නා සිරිවර්ධන ගෙදර අනුර සිරිවර්ධන අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2020 සැප්තැම්බර් මස 03 වැනි දින පෙ. ව. 10.00ට අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී , මා සම්මුඛ විය යුතුය.

තව ද, 2020 අගෝස්තු මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඉසෙඩ්. ඒ. එම්. ෆයිසල්.
ප්‍රාදේශීය ලේකම්,
අරණායක.

2020 ජූලි මස 23 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය අරණායක.

08- 152



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධිපත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*බද්දේගම ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය*: BDD/LND/02/79/4162/282.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/6/2012/HW/317.

ඉහත ශීර්ෂය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය (අති විශේෂ)* අංක 1986/4 දරන 2016 සැප්තැම්බර් 26 වැනි දින ඉඩම් අත්කර ගැනීම පිළිබඳ දැන්වීම යටතේ බද්දේගම ප්‍රාදේශීය ලේකම් විසින් අත්කර ගැනීමට කටයුතු කර ඇති ඉඩමේ විස්තර යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වල්පිට ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක ගා4162 දරන මූලික පිඹුරෙහි කැබලි අංක 282 වශයෙන් සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0079 යන්න පහත දැක්වෙන පරිද්දෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දන්වා සිටිමි.

***සංශෝධනය***

ගාල්ල දිස්ත්‍රික්කයේ බද්දේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වල්පිට ගමේ පිහිටි මැනුම්පති විසින් පිළියෙල කරන ලද අංක ගා 4162 දරන මූලික පිඹුරෙහි ;

**කැබලි අංක 282**

ඉඩමේ නම: ගොඩපරගහලියද්ද;
හිමිකම් කියන අය: රජය;
ප්‍රමාණය: හෙක්ටයාර් 0.0102.

සී. බී. කේ. ජානක ගුරුසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය,
බද්දේගම.

2020 ජූලි මස 08 වැනි දින දීය.

08- 189

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.